මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
දිනය 2023 මාර්තු මස 03 වන දින

## මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක 02-2023 මාර්තු

## ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නංවයි

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2023 මාර්තු මස 03 වැනි දින පැවති රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, 2023 මාර්තු මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි, පිළිවෙළින්, සියයට 15.50 සහ සියයට 16.50 දක්වා පදනම් අංක 100කින් ඉහළ නැංවීමට තීරණය කළේය.

ඉහළ මට්ටමක පවතින උද්ධමනය සහ උද්ධමන පුරෝකථන මෙන්ම නුදුරු කාලීන ඉදිරි දැක්ම පිළිබඳව පවතින ඉහළ අවිනිශ්චිතතා මධ්‍යයේ ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ තීරණාත්මක සාකච්ඡාවල අඛණ්ඩව නිරත විය. ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලය අතර උද්ධමන ඉදිරි දැක්ම සම්බන්ධයෙන් දරන මතයන්හි යම් වෙනස්කම් පැවතිණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය සියලුම පූර්ව ක්‍රියාමාර්ග සපුරාලීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, මුදල් මණ්ඩලය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලය මූලික සාකච්ඡාවලදී තීරණය කරන ලද මට්ටමට වඩා අඩු ප්‍රමාණයකින් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සඳහා එකඟතාවයකට එළැඹුණි.

විවිධ අංශයන්ගෙන් ආර්ථිකයේ ස්ථායීතාවය සහතික කිරීම උදෙසා රජය විසින් ඇරඹීමට කටයුතු කරමින් සිටින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම මෙම තීරණය මගින් පෙන්නුම් කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ක්‍රියාත්මක වීම මගින් සියලු පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ ලබා දීමට සහ විශ්වාසය ඉහළ නැංවීමට අපේක්ෂා කරන අතර එය තිරසාර පදනමකින් ආර්ථිකයේ ස්ථායීතාවය යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී වේ. මෙමගින් ඉදිරි කාලය තුළදී විදේශ විනිමය ප්‍රවාහ වැඩිවීම දිරිමත් කරනු ඇති අතර එය පවතින ආර්ථික අර්බුදයෙන් අත්මිදීම සඳහා උපකාරී වනු ඇත. ඉහළ ඔරොත්තු දීමේ හැකියාවකින් යුතුව ආර්ථිකය දැනටමත් අතිශය දුෂ්කර සහ පෙර නොවූ කාල පරිච්ඡේදයක් පසු කර ඇති බව මුදල් මණ්ඩලයේ අදහස වූ අතර අද දින

ලබා ගත් තීරණයත් සමග අපේක්ෂා කළ මට්ටමට වඩා වේගයෙන් උද්ධමනය පහළ යනු ඇතැයි දැඩිව විශ්වාස කරයි.

මෙම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය, ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ඉහළ මට්ටමක පවතින වෙළඳපොළ පොලී අනුපාතික අතර පරතරය අඩු කිරීමට උපකාරී වනු ඇතැයි මුදල් මණ්ඩලය අපේක්ෂා කරයි. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතියට සමගාමීව අවදානම අඩුවීම පිළිබිඹු කරමින්, වෙළඳපොළ පොලී අනුපාතික, විශේෂයෙන් රාජ්‍ය සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉදිරි කාලය තුළදී අඩුවීමත් සමග මෙම පොලී අනුපාතික අතර පවතින පරතරය තවදුරටත් අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුදල් මණ්ඩලය සියලු පාර්ශ්වකරුවන්ගෙන් අපේක්ෂා සහගතව පසුවන ලෙස ඉල්ලා සිටියි. මිල හා ආර්ථික ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා සිය කැපවීම මුදල් මණ්ඩලය නැවතත් අවධාරණය කරන අතර එමගින් ඉදිරි කාලය තුළදී මිල පීඩන ප්‍රමාණවත් පරිදි පාලනය වීමත් සමග පොලී අනුපාතික ව්‍යුහය සාමාන්‍යකරණය වනු ඇත.

<table>
<tr><td rowspan="4">මුදල් ප්‍රතිපත්ති තීරණය</td><td colspan="2">ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවූ අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පවතී<br>(2023 මාර්තු මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි)</td></tr>
<tr><td>නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)</td><td>15.50%</td></tr>
<tr><td>නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR)</td><td>16.50%</td></tr>
<tr><td>ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR)</td><td>4.00%</td></tr>
</table>

**තොරතුරු සටහන:**

මහ බැංකු අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් 2023 මාර්තු මස 03 වැනි දින ප.ව. 4.45ට ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්ථාගාරයේදී මාධ්‍ය හමුවක් පැවැත්වෙන අතර එය ෆේස්බුක් සහ යූ ටියුබ් ඔස්සේ සජීවීව විකාශය කෙරේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2023 අප්‍රේල් මස 04 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**ඇමුණුම 1**

## සංඛ්‍යා සටහන 01: උද්ධමනය

| මාසය | | ජූනි 22 | ජූලි 22 | අගෝ 22 | සැප් 22 | ඔක් 22 | නොවැ 22 | දෙසැ 22 | | ජන 23 | පෙබ 23 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂයමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 54.6 | 60.8 | 64.3 | 69.8 | 66.0 | 61.0 | 57.2 | කො.පා.මි.ද. (2021=100) | 51.7 | 50.6 |
| | ජා.පා.මි.ද. (2013=100) | 58.9 | 66.7 | 70.2 | 73.7 | 70.6 | 65.0 | 59.2 | ජා.පා.මි.ද. (2021=100) | 53.2 | - |
| **මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂයමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 39.9 | 44.3 | 46.6 | 50.2 | 49.7 | 49.4 | 47.7 | කො.පා.මි.ද. (2021=100) | 45.6 | 43.6 |
| | ජා.පා.මි.ද. (2013=100) | 49.3 | 57.3 | 60.5 | 64.1 | 62.4 | 60.1 | 57.5 | ජා.පා.මි.ද. (2021=100) | 52.0 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මැයි 22 | ජූනි 22 | ජූලි 22 | අගෝ 22 | සැප් 22 | ඔක් 22 | නොවැ 22 | දෙසැ 22 | ජන 23 |
| සංචිත මුදල් | 1,415 | 1,453 | 1,436 | 1,386 | 1,379 | 1,342 | 1,318 | 1,349 | 1,590 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 11,897 | 11,901 | 11,955 | 11,987 | 12,051 | 12,046 | 12,163 | 12,290 | 12,322 |
| ශුද්ධ විදේශීය වත්කම් | (2,083) | (2,122) | (2,124) | (2,035) | (1,893) | (1,873) | (1,870) | (1,767) | (1,573) |
| ශුද්ධ දේශීය වත්කම් | 13,980 | 14,023 | 14,079 | 14,022 | 13,944 | 13,919 | 14,033 | 14,056 | 13,895 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 6,523 | 6,697 | 6,826 | 6,990 | 7,043 | 7,178 | 7,293 | 7,471 | 7,612 |
| රාජ්‍ය සංස්ථා/ රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය | 1,750 | 1,729 | 1,754 | 1,700 | 1,703 | 1,778 | 1,760 | 1,747 | 1,748 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 7,755 | 7,714 | 7,673 | 7,614 | 7,577 | 7,530 | 7,499 | 7,414 | 7,318 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 14,340 | 14,335 | 14,410 | 14,451 | 14,540 | 14,547 | 14,676 | 14,840 | - |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 03: පොලී අනුපාතික

| **පොලී අනුපාතික (%)** | **2022 සැප් අවසානයට** | **2022 ඔක් අවසානයට** | **2022 නොවැ අවසානයට** | **2022 දෙසැ අවසානයට** | **2023 ජන අවසානයට** | **2023 පෙබ අවසානයට** | **2023 මාර් 03 දිනට** |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 14.50 | 14.50 | 14.50 | 14.50 | 14.50 | 14.50 | 15.50 (අ) |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 15.50 | 15.50 | 15.50 | 15.50 | 15.50 | 15.50 | 16.50 (අ) |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 15.50 | 15.50 | 15.50 | 15.50 | 15.26 | 15.27 | 15.50 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 31.94 | 33.05 | 32.91 | 32.64 | 29.91 | 29.72 | 29.59 (ආ) |
| දින 182 | 30.59 | 32.53 | 32.27 | 32.20 | 28.72 | 28.67 | 28.64 (ආ) |
| දින 364 | 29.85 | 29.60 | 29.46 | 29.27 | 27.78 | 27.67 | 27.64 (ආ) |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 25.95 | 27.46 | 27.89 | 27.24 | 24.82 | 23.45 | 23.45 |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 17.58 | 17.94 | 18.42 | 18.70 | 18.66 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 24.93 | 25.83 | 26.04 | 26.20 | 25.82 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 11.63 | 12.60 | 13.37 | 14.06 | 14.63 | 14.74 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 15.41 | 16.66 | 17.59 | 18.49 | 19.15 | 19.23 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 22.06 | 23.22 | 23.63 | 23.07 | 22.24 | - | - |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 22.55 | 23.61 | 24.05 | 23.73 | 22.78 | - | - |

(අ) 2023 මාර්තු මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

(ආ) 2023 මාර්තු මස 01 වැනි දින පැවති වෙන්දේසියේ එලදා අනුපාතිකය